පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය : : චිත්‍ර කලාව

සතිය : හයවන සතිය

ශ්‍රේණිය : 6


සකස් කිරීම : D.P.එපිටවත්ත මිය

මාවනැල්ල අධ්‍යාපන කලාපය

## ක්‍රිස්තියානි දේවස්ථාන


- ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශවල ක්‍රිස්තු දහම ව්‍යාප්ත වූයේ 16 වන සියවසේදී ය. ක්‍රිස්තියානි දේවස්ථාන ඉදි කිරීම සඳහා පෘතුගීසීන් මුල් විය.
- . ශ්‍රී ලංකාවේ ක්‍රිස්තියානි දේවස්ථාන රෝමානු හා ගොතික් යන නිර්මාණ ශෛලි 2 අනුව
- නිර්මාණය කර ඇත.
- . රෝමානු ක්‍රමයේ දේවස්ථාන බොකු වහල හා රවුම් ආරුක්කුවලින් සමන්විත වේ. මෙම දේවස්ථානවල ප්‍රධාන දොරටුවට ඉහළින් අලංකාර වීදුරුවලින් නිමවා ඇති වෘත්තාකාර කවුළුවකි. එය Rose window ලෙස හැඳින්වේ.
- . ගොතික් ක්‍රමයේ දේවස්ථාන තුඩු සහිත ආරුක්කුවලින් හා දෙපසට දළ බෑවුම් ඇති වහල සහිතව නිර්මාණය කර ඇත. මෙම දේවාස්ථානවල තුඩු සහිත කවුළු රංජිත වීදුරුවලින් අලංකාර කර ඇත.
- . රංජිත වීදුරු නිර්මාණවල ක්‍රිස්තියානි ආගමට අයත් විවිධ අවස්ථා හා චරිත නිරූපණයඉකර ඇත.
- . දේවස්ථානයක බිම් සැලැස්ම කුරුසික හැඩය ගන්නා අතර එය අල්තාරය, කාමරඉදිග් ශාලාව, කුලුනු, බයිබලය කියවන ස්ථානය හා පිවිසුම් දොරටුව යන අංගවල සමන්විත වේ.
- දිග් ශාලාවේ එක් කොනක 'අල්තාරය' හෙවත් 'පූජාසනය' අලංකාර වැටක් සහිත ව
- නිමකොට ඇති අතර ඒ පිටුපස බිත්තියේ බොහෝ විට චිත්‍රයෙන්, කැටයමින් හෝ
- රංජිත වීදුරුවලින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය කර ඇත.
- ශ්‍රී ලංකාවේ ප්‍රධාන කිතු දේවස්ථාන කිහිපයක් පහත දැක්වේ.
- බොරැල්ලේ - සියලු ශාන්තුවරුන්ගේ දේවස්ථානය
- කොළඹ - ලන්දේසි පල්ලිය
- ගාල්ල - බලකොටුව තුළ පිහිටි කිතු දේවස්ථානය

- රංජිත වීදුරුවලින් ක්‍රිස්තුස්වහන්සේගේ චරිත අවස්ථා හා සිද්ධි නිරූපණය





## කිතු දේවස්ථානයක බිම් සැලැස්ම





1. අල්තාරය
2. කාමර
3. දිග් ශාලාව
4. ස්තම්භ(කුලුනු)
5. බයිබලය කියවන ස්ථානය
6. පිවිසුම් දොරටුව

*රෝමන් ක්‍රමයේ දේවස්ථානය*

### රෝමන් ක්‍රමයේ දේවස්ථානය


කුරුසිය වෘත්තාකාර කවුළුව (Rose window)



ආරුක්කුව (Round arch)

### ගොතික් ක්‍රමයේ දේවස්ථානය

කුරුසිය දළ බැවුම් සහිත වහල



බොකු වහල සහිත

උල් වූ තුඩු සහිත ආරුක්කු

(Pointed arch)

- . කියවීම් පත්‍රිකා කියවා තේරුම් ගන්න.
- . රූප සටහන් අධ්‍යයනය කරන්න.
- . ඔබ අදාළ තේමාව යටතේ ක්‍රියාකාරකමෙහි යෙදෙන්න.

1 **ක්‍රියාකාරකම** - රෝමන් ක්‍රමයේ දේවස්ථානයක රූප සටහනක් ඇඳ කොටස් නම් කරන්න.

2 **ක්‍රියාකාරකම** - ගොතික් ක්‍රමයේ දේවස්ථානයක රූපසටහනක් ඇඳ කොටස් නම් කරන්න.

3 **ක්‍රියාකාරකම** - දේවස්ථානයක බිම් සැලැස්මක් ඇඳ කොටස් නම් කරන්න.

4 **ක්‍රියාකාරකම** - ශ්‍රී ලංකාවේ දේවස්ථාන කිහිපයක් හා ඒවා පිහිටි ප්‍රදේශ ඇතුළත් වගුවක් පිළියෙල කරන්න.